**#mediaethicsSL #SinhalaPress #lka #Divaina #Mawbima #Resa #Ada**

නිරවද්‍යතාවය ආරක්ෂා කිරීමට හැකි සෑම සාධාරණ උත්සාහයක්ම ගැනීම යනු, පිළිපැදිය යුතු ඉතාමත් වැදගත් ජනමාධ්‍ය ආචාර ධර්මයකි. කෙසේ වෙතත් සිතාමතාම නොවුණත්, මූලාශ්‍රයන්ගෙන් ලැබෙනා තොරතුරු නිවැරදි නොවීම හෝ ප්‍රමාද දෝෂයන් නිසාවෙන් ප්‍රකාශයට පත් කෙරෙනා යම් යම් කරුණුවල නිරවද්‍ය භාවයට ගැටළු ඇතිවීම සිදුවිය හැක්කකි. එසේ වුවද, ප්‍රමාද දෝෂයකින් වුවත් වැරදි අදහසක් හෝ වැරදි කරුණක් ඉදිරිපත් වන්නේ නම් එයින් පාඨකයා නොමග යා හැක. එවන් ප්‍රමාදයක් සිදුවූ විටදී ගත හැකි ආචාර ධාර්මික පියවර වන්නේ එය හැකි ඉක්මනින් නිවැරදි කිරීමයි.

උදාහරණ ලෙසින් දක්වන්නේ නම්, 'මරණ දඬුවම අහෝසි කිරීමේ පනතට එරෙහි පෙත්සම් 3ක් උසාවිය නිශ්ප්‍රභ කරලා' යන මැයෙන් දිවයින පුවත්පතෙහි පළ වූ ලිපිය පෙන්වා දිය හැක. මෙම පුවතම අද, රැස හා මව්බිම පුවත්පත් තුළ නිවැරදිව පළව ඇත්තේ, මරණ දඬුවමට එරෙහි පෙත්සම් 3 ක් ඉවත දමා ඇති බවටයි. කෙසේ වෙතත් මෙහිදී දිවයින ලිපියේ අන්තර්ගතය තුළ නිවැරදි අදහස අඩංගු වී ඇති බවද දැක්විය හැකි අතර, මේ අනුව සිදුවී ඇත්තේ සිරස්තල යෙදීමේදී වරදක් සිදුවීම බව අනුමාන කළ හැක. එසේ වුවත් එය නිවැරදි කිරීමක් කිරීම අනිවාර්යයෙන්ම සිදුවිය යුත්තක් නොවේද?